


**B.A.THISENI ONADEE BANDARA**

# ගස් මුදුනේ සිට ගී ගයන කොහාගේ සත්‍ය කතාව

B.A.THISENI ONADEE BANDARA

# ගස් මුදුනේ සිට ගී ගයන කොහාගේ සත්‍ය කතාව

බී.ඒ.තිසෙනි ඔනාදි බණ්ඩාර

5 ශ්‍රේණිය D

මහාමායා බාලිකා විදුහල

මහනුවර

මුද්‍රණය

2025.02.08

කතෘ ගේ වෙනත් කෘති

- කඩිසර කුඹියෝ
- නරක මිතුරු ඇසුර
- කවි සහ තේරවිලි

ISBN– 978 – 624 – 208 - 184 - 7

## පිදුම

මිණිකැට මෙන් මුතු අකුරු එකිනෙක

පද බැද

සිප් සතර මුල පුරන්නට දිරිය දුන්

මාගේ භද්‍රා ගුරු මෑණියන්ටද

නිතැතින් මාගේ සෙවනැල්ල මෙන්

හිඳිමින් සියලු කාර්යන්ට ශක්තියක්

වන

මාගේ මවට , පියාට

පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙනේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතිය ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් පාසල් ප්‍රජාවම ආදි කතෘ කරංදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

අපේ කිරිඅම්මාගේ වත්තේ කොස් ගහක් කපද්දි කිසිම හැඩයක් පිළිවෙලක් නැති කපුටු කූඩුවක් බිම වැටුණා.

නංගියි, මමයි දිව ගියා එය බලන්න.

ඒ කපුටු කූඩුවේ කොහා පැටවුන් තුන් දෙනයි, කපුටු පැටවුන් දෙන්නෙකුයි හිටියා.

පස් දෙනාම කළු ම කළුයි. කොහා පැටවුන්ගේ හොටය පුංචියි. කපුටු පැටවුන්ගේ හොටය ශක්තිමත් වගේ.



කිරිඅම්මාත් අපි දෙන්නාත් ගිහින් මේ පැටවුන් එක්කම කූඩුව ගෙදර ගෙනාවා. හොඳින් කන්න බොන්න දුන්නා. හොඳින් බලා ගත්තා.

කපුටු පැටවුන් ටිකක් ලොකුයි.

දින කීපයක් ඔවුන් පස් දෙනා අත්තෙන් අත්තට පැන ගියා. කපුටු අම්මා කෑ ගසමින් පැමිණ ඉගිලෙන්න පුරුදු කරලා තමාගේ දරු දෙදෙනා රැගෙන ගියා.

එහෙම වූ වත් බිත්තර රැකලා හැදුණ කොහා පැටවුන් පුංචිම කාලේ කපුටු අම්මා බලාගත්තා, කන්න දුන්නා.

වෙනසක් හොයා ගන්න බැරි කාලේ කපුටු අම්මා බිත්තර පරිස්සම් කරමින් පසුව කුඩා කුරුලු පැටවුන් පෝෂණය කරමින් සිටියත් ටිකක් ලොකු වෙද්දි වෙනස තේරිලා කපුටු අම්මා කොහා පැටවුන්ට කොටන්න ගත්තා.

ඉතිරි වුන අසරණ කොහා පැටවුන් ගැන අපිට දුක හිතුණා.

කපුටු පැටවුන් කූඩුවෙන් ගිය පසු ඉතුරු වූ කොහා පැටවුන් දෙදෙනා පුංචිම පුංචි ළමයි වගේ කූඩුවේ තනිවෙලා තවමත් අපි ලබා දෙන කෑම වතුර වලින් ජීවත් වුණා. දැන් මෙයාලට කපුටු අම්මත් නෑ. කොහා අම්මත් නෑ. ඉතිං අම්මලාගේ ආදරේ මෙහෙම වෙන්න පුළුවන්ද කියලා මම කල්පනා කලා.



පසු දින උදෑසන ඉගිලෙන්න උත්සාහ කළ කොහා පැටියෙක් ගහේ අත්තෙන් ඈතට ඉගිලිලා ගිහින්. කපුටු කූඩුවේ බිත්තර දාලා ගිය කොහා අම්මා නම් කිසිම දවසක අවේ නෑ.

යාන්තමින් පියෑඹූ කොහා පැටවුන් ගේ ළඟ කෝපි ගහේ අත්තක හිටියා. අපි හැම විටම කන්න බොන්න දුන්නා.



එදා සෙනසුරාදා දවසක් නංගිත් මමත් පොත්වල වැඩ කරමින් සිටියා. ඒ වෙලාවේ කවුදෝ සතෙක් බියෙන් වගේ ගේ පිටුපසින් කෑගසන හඬ ඇසුණා. ඒ හඬ මට හුරුයි වගේ.



දොර ඇරලා බලද්දි ආයෙම කපුටෙක් ඇවිත් කොහා පැටියන්ට කොටනවා අනේ! හරිම දුකයි.



අපි කපුටා එලවා දමා කොහා පැටවුන් බේරා ගත්තා. හොඳින් ඉගිලෙන තෙක් කෑම දීලා රැක බලා ගත්තා.

සති දෙකක් පමණ ගත වුණා.

කොහා පැටවු උස් ගස් වලට ඉගිල ගියා. තවමත් ඕනේ වුනාම අපේ අතින්ම කෑම කාලා යන්න ආවා.

දින දෙක තුනක් මෙහෙම අපේ අතින්ම කෑම කාලා තමයි හිටියේ.

දැන්නම් ටිකක් ලොකුයි. ඉගිල්ලෙන්නත් පුළුවන්.



අන්තිම දවසේ උස අත්තක සිට අප දෙස බලාගෙන පුරුදු ආවේණික හඬින් කෑ ගසා ඈතට යන්න ගියා.

ඔවුන්ගේ ලෝකයට ම ඉගිල ගියා අයේ කවදාවත් ම ආවේ නෑ.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනය ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ ධරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ ඔක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්